අපේ දරුවන්ට සංගීතයේ මං පෙත් විවර කරන්නට

# "ස" සංගීත ඇකඩමිය



මේ ගෙවියන්නේ අපේ කාලයයි. එළැඹෙන්නේ අප දරුවන්ගේ කාලයය

ක්‍රමවේදයකට අනුව නිවැරදි ගුරු මඟපෙන්වීමක් මතින් සිදුවිය යුතුය.

මේ ජීවන තීර්ථයේ අපි දේශාන්තර සංචාරකයෝ-යැයි කීම වැරැද්දක් නොවන්නේ උපන් බිමේ මුදුන් මුල් රඳවා පෝෂණ මුල්පොකුරු සහිතව ඕස්ට්‍රේලියාවට සංක්‍රමණයවූවෝ වන බැවිනි. අතීතකාමයෙන් මිදීම පහසු නැත. 'කන්දේ ලන්දේ ගඟුලැල්ලේ පේනා තෙක් මානේ, මන බැන්දේ වින්දේ සුවපහසේ වාසේ ගම්මානේ'' යන්න අපට කෙදිනකවත් අමතක කළ නොහැකිය.

මේ ගෙවියන්නේ අපේ කාලයයි. එළැඹෙන්නේ අප දරුවන්ගේ කාලයයි. අප මව්රටට ගෙනයාමට කුරුළු පිහාටු ගෙන දුරකතර ගෙවා කැන්ගරු දේශයට අප දෙමාපියන් එන්නේද නැත. එහෙත් අප දරුවන්ට මව්බිමේ උරුමය එක පැහැර කියාදීමට අප සැමගේ යුතුකම බව වැටහෙන්නේ මෙහි වෙසෙන සියළුම දෙමාපියන් තම දරුවන් කුමක් හෝ බාහිර ක්‍රියාකාරකමකට යෙදවීමට උත්සුකවන ආකාරය දැකීමෙනි. එය ඉතා ඉහළින් අගය කළ යුතු දෙයකි.

බොහෝ දෙමාපියන් වැඩි රුචියක් දක්වන්නේ තම දරුවන් කලාවට, සාහිත්‍යයට නැඹුරු කිරීමට බව නිතර දෙවේලේ දකින සංදර්ශනයන්ට සහභාගිවන දුවා දරුවන්ගෙන් අපට වැටහෙයි. සංගීතයට, කලාවට යොමුවන දරුවා අනාගතයේ සමාජ සංවේදී හදවතක් ඇති රමණීය ලෙස ජීවිතය විඳින්නට හැකි අයෙකු වනු ඇති. ඔවුන් සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් බැහැරවී හැදියාවන්ගෙන් සන්නද්ධ වනු ඇති. මේ සියලු දේ නිසි නියාමනයකට ගොනු කරගැනීමට ඉගෙන ගන්නා ශිල්පය නිවැරදි

මේ අනාගතයට පියමනින දරුවන්ගේ වාසනාවට පුරා වසර ගණනාවක් සංගීත ක්ෂේත්‍රය තුළ ජයකෙහෙළි නැංවූ ප්‍රවීණ සංගීතවේදීන් කිහිප පොළක් දැන් මෙල්බන් නුවරට සපැමින ඇති බැවින් නියමාකාරයෙන් ඔවුන් වෙතින් ශාස්ත්‍රය උගත හැකියි. එමතු ද නොව සංගීත පවුල් වලින් පැවත එන ශිල්පීන් ශිල්පිණියන්ගේ දරුමල්ලන් ද සංගීතය පිළිබඳ වැඩිදුර අධ්‍යයනය සඳහා මෙහි පැමිණ සිටිති. ප්‍රවීන තරුණ ශිල්පීන් කිහිප පොළක්ද පැමිණ සිටිති. මෙම යුග දෙකක ශිල්පීන් එකතුවී සංගීතය මනා ලෙස ඉගැන්වීමට නොබෝ දා ''ස'' නමින් සංගීත ඇකඩමියක් ආරම්භ කළහ. එහි ආරම්භක කටයුතු සැප්තැම්බර් 14 වෙනි ඉරුදින ක්‍රෙගිබන් හිදි සිදුවිය. එහි මූලිකත්වය ගෙන කටයුතු කරන ප්‍රවීන සංගීතවේදි ජූඩ් ප්‍රනාන්දු සමඟ කෙටි පිළිසරදක යෙදීමට මා හට අවස්ථාව හිමි විය.

සන්නස : ජූඩ් අපිට කියන්න මේ වැඩේ පරමාර්ථය

ජූඩ් : මෙහි මූලික පරමාර්ථය, අපේ සංගීතය, එහෙමත් නැත්නම් සිංහල සංගීතය, අපේ බාල පරපුරට ඉගැන්වීම. මොකද මමත් දැන් මෙල්බන් නුවරට ඇවිල්ලා වසර 5 කට කිට්ටු කාලයක් වෙනවා. මමත් මෙහෙට ගොඩබැස්ස දවසෙ ඉඳල ප්‍රසංග වලට සහභාගි වෙනවා. එහිදි දැක්ක දෙයක් තමයි බොහෝ දරුවන් අපේ දේවල් වලින් වේගයෙන් ඈත්වීම. දෙමාපියන්ට අපේ දේ කියාදීමට උනන්දුවක් තිබුනත් දරුවන්ගේ උනන්දුවේ අඩුවීමක් පෙනෙනවා. එයට ඔවුනට වැරැද්දක් කියන්න බෑ. මොකද ඔවුන්ට බොහෝ වෙලාවට වැඩ කටයුතු කරන්න සිද්ධ වෙන්නෙ මෙහෙ ආකාරයට. ඉතින් දෙමාපියන්ට ඕනෙකමක් තිබුනත් හරි විධියට ශිල්පය කියාදෙන තැනක් නොමැති වීම. ඒ නිසයි අපි කීප දෙනෙක් එකතු වෙලා 'ස' සංගීත ඇකඩමිය පටන් ගත්තේ. මොකද අපෙන් පස්සේ අපේ කලාව ඉදිරියට අරන් යන්න නිවැරදි ශිල්පීය දැනීමක් ඇති පිරිසක් බිහිකළ යුතුයි.

සන්නස : මේ ඉගැන්වීමේ මූලිකත්වය දෙන්නේ සිංහල සංගීතයට විතරද ?

ජූඩ් : නෑ... එහෙම එකක් නෑ... සිංහල සංගීතයත් එක්කම බටහිර සංගීතයත් උගන්වනවා. ඒ වගේම රාගධාරි සංගීතය වැනි දේත් උගන්-වනවා. මූලික අපේ පරමාර්ථය තමයි නිවරදි ආකා-ාරයට මුල සිට සංගීතය ඉගැන්වීම. සංගීත



ප්‍රස්ථාරයක. හදවීබ එකක් ලිවීමේ කියවීමේ සිට ක්‍රමානුකූලව සංගීතය ඉගැන්වීම තමයි මූලික පරමාර්ථය. එහෙම නැතිව කෙලින්ම සංගීත සංදර්ශන වලට යොමුකිරීම නෙවෙයි. නමුත් හරිවිදියට ඉගෙනගත්තට පසුව දෙමාපියන්ට සතුටු විය හැකි ආකාරයේ ප්‍රසංගයක් ඉදිරිපත් කරන්නත් බලාපොරොත්තු වෙනවා. ඊකට උදාහරණයක් තමයි අපේ ළමයින්ගෙන් අපි හදාපු 'ඩයිනමික්ස්' සංගීත කණ්ඩායම.

සන්නස : හොඳයි මොනවද ඔබලා උගන්වන සංගීත භාණ්ඩ

ජූඩ් : මූලික වශයෙන් වයලීන්, ගිටාර්, ඩ්‍රම්ස්, කීබෝඩ් වැනි සංගීත භාණ්ඩ, ගිටාර් වල එන රිදම්, බෙස්, ලීඩ්. ඒ වගේම සර්පිනා (හර්මෝනි යම්)



ශ්‍රීනාත් මද්දුමගේ

එකත් උගන්වනවා.

සන්නස : මේවා උගන්වන ගුරුවරුන් කවුද කියා දැනගන්න සන්නස පාඨකයින් කැමති ඇති. ඒ ගැනත් පොඩ්ඩක් මතක කළොත්.

ජූඩ් : වසර ගණනාවක් සංගීතය ඉගැන්වූ ශ්‍රී ලංකාවේ ප්‍රකට වයලීන වාදකයෙක් වන ඩී. ඩී. ගුණසේනයන් සහ තිසර බණ්ඩාර වයලීනය උගන්-වනවා. තිසර මේ වන විට ඔහුගේ උපාධිය සහ මාස්ටර්ස් එක අවසන් කර තිබෙනවා. කීබෝඩ් වාදනය උගන්වන්නේ ප්‍රවීන සංගීතවේදියෙක් ලෙස වසර ගණනාවක පළපුරුද්දක් ඇති කුමරන් කොළඹගේයි. අමතරව බේස් ගිටාරය, ලීඩ් ගිටාරය සහ ඩ්‍රම්ස් වාදනය මම උගන්වනවා.

සන්නස : කොහෙද මේ ඇකඩමිය පවත්වාගෙන යන්නේ

ජූඩ් : නො. 7, ගැසොලින් වේ, ක්‍රැගිබන්.

ඔබේ දරුවාට සංගීතය පිළිබඳ කුමානුකූලව ඉගැන්වීම සඳහා හොඳම ස්ථානය 'ස' ඇකඩමිය යැයි අපි සිතනවා. එමන්දයත් වාසනාවට මෙහි වෙසෙන මෙවැනි ප්‍රවීනයන්ගෙන් සංගීතය ඉගැනීමට ලැබුනු අවස්ථාව භාග්‍යයක් ලෙසයි අපට සිතෙන්නේ. එබැවින් ඔබේ දරුවා හෝ ඔබට වයස් පරතරයක් නැතිව සෑම ඉරිදාවකම සවස පැවැත්වෙන මෙම සංගීත පන්තිය විවෘත බව ජුඩ් ප්‍රනාන්දු ප්‍රකාශ කලා. නිවැරදි අකාරයට කලාව හැසිරවිය හැකි පරපුරක් කැන්ගරු-දේශයේ පිහිටුවීමට ඔවුන් ගන්නා උත්සාහයට 'සන්නස' සුභ පතනවා.

